සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved.*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **චිත්‍ර කලාව - I** **කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01 මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ ............................................................................................ නැමැති කැටයමයි.

02 මෙය අපට දැක ගැනීමට හැකි වන්නේ ................................................................ විහාරයේ පොකුණ හා සම්බන්ධ පිහිටි පර්වතයේ ය.

03 මෙහි වාඩිවී සිටින මිනිසා හිඳ සිටින ඉරියව්ව ............................................................................ ක්‍රමය ලෙස හඳුන්වයි.

04 ප්‍රතාපවත් බව, චාම් බව හා අඟ පසඟවල දිගටි ස්වරූපය නිසා ........................................................ කලා ලක්ෂණ බලපා ඇතැයි අනුමාන කෙරේ.

05 පරණවිතාන මහතාගේ මතයට අනුව මිනිස් රුවෙන් හා අශ්ව හිසෙන් ............................................................ සංකේතවත් කෙරේ.

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06 ඉස්ලාම් දේවස්ථාන දෙපස උල් තුඩකින් යුතුව ඉදිකර ඇති කුළුණු විශේෂය හඳුන්වන නම කුමක් ද?

..............................................................................................................................................

07 විදේශීය ආධිපත්‍යයට නතුවී එම සංස්කෘතියට ගැතිකම් කළ ශ්‍රී ලාංකික බොදු බැතිමතුන් සඳහා බෞද්ධ සිතුවම් කලාවක් හඳුන්වා දුන් ශිල්පියා කවුද? ....................................................................

08 විවිධ උත්සව අවස්ථාවන්වල දී සාම්ප්‍රදායික පොල්තෙල් පහන තබන තැන බිමට යෙදූ සැරසිල්ල හඳුන්වන නම කුමක් ද? ..............................

09 අතීතයේ චිත්‍ර ශිල්පයෙහි යෙදුනු ආධුනිකයාට රේඛා අභ්‍යාස පුහුණු කරවනු ලැබූ පුවරුව කුමන නමකින් හැඳින්වේ ද? ..............................

10 ලාක්ෂා කර්මාන්තයේ දී වර්ණ සාදා ගැනීමේ දී කහ වර්ණය ලබා ගැනීමට එක් කළ ද්‍රව්‍ය කුමක් ද?

..............................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 කාටූන් චිත්‍රවල ප්‍රධාන අරමුණක් වන්නේ,

(1) වේගවත් පණිවිඩයක් සමාජයට ලබාදීම (2) සියුම් උපහාසය හා විනෝදය මගින් අවධාරණය
(3) දේශපාලකයන්ට පහර ගැසීම (4) පාඨකයාට විනෝදය සැපයීම

12 නෙෆර්ටිටි රැජිණ දැක්වෙන මූර්තිය සම්බන්ධයෙන් වඩාත් ම නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) රතු වැලි ගලින් කර වර්ණාලේප කර ඇත. (2) හුණු ගලින් කර වර්ණාලේප කර ඇත.
(3) කිරිගරුඬ පාෂාණයෙන් කර ඇත. (4) හුණු ගලින් කර ස්වර්ණාලේප කර ඇත.

13 පහතරටට ආවේණික වර්ණ හා රටා වලින් යුතු ''කතළුව'' පූර්වාරාමයෙහි බිතු සිතුවම් ඇඳ ඇත්තේ,

(1) වියළි බදාමය මතය (2) තෙත බදාමය මතය
(3) වියළි බදාමය මත බන්ධන මාධ්‍යයක් යොදාගෙනය (4) ඝන රෙදිකඩ මතුපිටය

14 ඉනුවිල් පරරාජසේකර පිල්ලෙයාර් කෝවිලෙහි බිතු සිතුවම් ඇඳි ශිල්පියා වන්නේ,

(1) තාවඩි මුත්තු තුරෙයිසාමි ශිල්පියා ය. (2) පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියා ය.
(3) වෛතීසවරම් සිවසුබ්‍රමණියම් ශිල්පියා ය. (4) සී. සිවඥානසුන්දරම් ශිල්පියා ය.

15 මහනුවර බිතු සිතුවම් කලාවට ආවේණික ලක්ෂණයක් නොවන්නේ,

(1) තීරු චිත්‍ර සංරචන ක්‍රමය (2) ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය
(3) ත්‍රිමාණ ලක්ෂණ සහිත පර්යාවලෝකනය (4) පාර්ශවදර්ශී ලෙස රූප නිර්මාණය

- **ප්‍රශ්න අංක 16 සිට 20තෙක් දී ඇති වාක්‍යයන්හි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.**

16 ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර කලාවේ නව සම්ප්‍රදායක් වන වියුක්ත කලා සම්ප්‍රදාය (Abstract) බිහිකිරීමට පුරෝගාමී වූ .............................. මහතා අති විශිෂ්ට නිර්මාණ ශිල්පියෙකි.

17 මහනුවර යුගයට අයත් හොඳම සඳකඩ පහණ දැකිය හැක්කේ .............................. පිවිසෙන දොරටුව අසළ පිටගැට පෙළ පාමුල ය.

18 කිසියම් නව කථාවක්, කෙටි කථාවක්, විශේෂාංග ලිපියක්, කාව්‍ය පන්තියක් සඳහා අඳිනු ලබන චිත්‍ර .............................. ලෙස හැඳින් වේ.

19 කිසියම් සිද්ධියක්, අවස්ථාවක්, හැඟීමක් මුල්කරගෙන වර්ණ හා රූප සම්පිණ්ඩනය මගින් අදහස් මතුකර පෙන්වීම .............................. චිත්‍රයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වේ.

20 ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා විසින් අඳින ලද ''අවසන් රාත්‍රී භෝජනය'' නැමති සිතුවම ඇඳ ඇත්තේ .............................. නම් තාපසාරාම බිත්තියේ ය.

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් දී ඇති **A, B, C, D, E** යන රූප අතරින් තෝරා එහි ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| 21 |  | (..................) |  | A |
| 22 |  | (..................) |  | B |
| 23 |  | (..................) |  | C |
| 24 |  | (..................) |  | D |
| 25 |  | (..................) |  | E |

2

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

26 පේකඩ ..............................................................................................

..............................................................................................

27 ඇලෙක්සැන්ඩ්‍රෝස් ..............................................................................................

..............................................................................................

28 මුළුතල සැරසිලි ..............................................................................................

..............................................................................................

29 ආම්ලාකාර ..............................................................................................

..............................................................................................

30 නියඳ පෝරුව ..............................................................................................

..............................................................................................

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**

|  |  |  |  |  |
|---|---|---|---|---|
| F | G | H | I | J |

31 F අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ලෙහි වාස්තු නිර්මාණ ශිල්පියා කවුද? ....................................................

32 G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කර ඇති ශිල්ප ක්‍රමය කුමක් ද? ....................................................

33 H අක්ෂරයෙන් දැක්වෙන රූපයෙහි ඇති මූර්තිය නිමකොට ඇති මාධ්‍යය ලියන්න. .........................................

34 I අක්ෂරයෙන් දැක්වෙන අභයගිරි විහාර භූමියෙහි ඇති මෙම ප්‍රතිමාවේ දැක්වෙන මුද්‍රාව කුමක් ද? ......................................................................

35 J අක්ෂරයෙන් දැක්වෙන රූපයෙහි ඇති කාන්තා රුව හැඳින්වෙන්නේ කිනම් නමකින් ද? ......................................................................

- **පහත දැක්වෙන වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාලව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතු වනු ඇත.)**



36 හඳුනාගත්බව ..................................................................................................................

..................................................................................................................

37 නිරූපිත තේමාව ..................................................................................................................

..................................................................................................................

38 ශිල්පියා පිළිබඳව ..................................................................................................................

..................................................................................................................

39 සම්පිණ්ඩනය හා මාධ්‍ය ..................................................................................................................

..................................................................................................................

40 ප්‍රකාශිත හැඟීම් ..................................................................................................................

..................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** | **චිත්‍ර කලාව - II** | **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- ★ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** පැහැදිලි ව සටහන් කරන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- ★ සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබිමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා රළු කඩදාසියක් භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

★ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- රේඛා අධ්‍යයනය
  1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේදී දක්වන කුසලතා
- වර්ණ චිත්‍රය
  2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
  6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සැලකිය යුතුයි

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය**

# චිත්‍ර කලාව - II

**ආදර්ශ ද්‍රව්‍ය ඇටවුම හා ශාලාධිපති උපදෙස්**

- රූප සටහනෙහි දක්නට ඇති අයුරින් ද්‍රව්‍ය සමූහය සකස් කරන්න.
- ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමට පහළින් සිටින සේ සකස් කරන්න.
- පැළෑටියේ ඉහළ සීමාව ඇස් මට්ටමින් ඉහළ පිහිටීම වරදක් නොවේ.
- දළ සටහන් පත්‍රය හා වර්ණ චිත්‍රය වශයෙන් චිත්‍ර දෙකක් ඇඳීමට උපදෙස් දෙන්න.

**සපයා ගත යුතු ද්‍රව්‍ය**

- සුදු කඩදාසියකින් ආවරණය කරන ලද 23cm x 23cm x 12cm ප්‍රමාණයේ හෝ ඊට ආසන්න ප්‍රමාණයක කාඩ්බෝඩ් පෙට්ටියක්
- **විශ්කම්භය අඟල් 8 - 9 ප්‍රමාණයේ මල් පෝච්චියක් (ප්ලාස්ටික් කළු හෝ වර්ණවත්)**
- වර්ණවත් ඉරි සහිත සර්වියට් එකක්
- පත්‍ර තුනක් හා මලක් සහිත ඇන්තූරියම් පැළයක්
- තැඹිලි ගෙඩියක්
- ද්‍රව්‍ය තැබීමට ආධාරකයක් (ඩ්‍රෝවින් බෝඩ්)



සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - III

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆේල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
  ඇඳීමට සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ. (ජාතික මට්ටමේ විභාගයේදී පමණි.) (පළාත් මට්ටමේ තමන් විසින් සපයා ගත යුතුය.)

---

- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

### "අ" කොටස - චිත්‍ර සංරචනය

(01) ඇලක හෝ දොලක සතුටින් දිය නාන පිරිසක්

(02) නිවසේ පැවති දානමය පිංකමක්

(03) සත්ත්ව ගොවිපලක සේවයෙහි යෙදෙන්නෝ

(04) කන්දේ විහාරයේ රාත්‍රී ඇසළ පෙරහැර

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

(05) ස්වභාවික මලක් හා කොළයක් ඇසුරින් චීත්ත රෙද්දක් මුද්‍රණය කිරීමට ව්‍යාප්ත මෝස්තරයක අඟල් 9 x 9 ප්‍රමාණයේ කොටසක් ඇඳ චමත්කාරජනක ලෙස වර්ණ ගන්වන්න.

(06) අඩි 8 x 6 ප්‍රමාණයේ ඇඳ ඇතිරිල්ලකට සුදුසු මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

(07) වියුක්ත හැඩතල යොදාගනිමින් බතික් ගවුමකට වාටි මෝස්තරයක් නිර්මාණය කරන්න. අදාළ ලෙස වර්ණ ගන්වන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(08) ''කොරෝනා නිම කරමු - යළිත් රට ගොඩනගමු'' මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(09) ''පිය සෙනෙහස'' පිළිබඳ ලියවුණු කාව්‍ය පන්තියක් සඳහා වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

(01) මිනිසා හා අශ්ව හිස (02) ඉසුරුමුණිය (03) මහා රාජ ලීලාසන (04) පල්ලව

(05) අග්නි හා පර්ජන්‍ය (06) මිනාර් / මිනරේට්

(07) එම්. සාර්ලිස් (08) අල්පනා මෝස්තරය (09) යටිපෝරුව (10) හිරියල්/රන් හිරියල්

(11) 2 (12) 2 (13) 1 (14) 2

(15) 3 (16) එච්. ඒ. කරුණාරත්න මහතා (17) දළදා මාළිගයට

(18) සන්නිදර්ශන චිත්‍ර (19) ප්‍රකාශන (20) ශාන්ත මරියා ඩෙලා ග්‍රේසි

(21) C (22) D (23) B (24) E (25) A

(26) පේකඩ ලෙස හඳුන්වන්නේ සිරස් ලී කණු ඉහළ බාල්කය හා සම්බන්ධ වන කොටස්වල සතර පැතිවලට නැමුණු ලෙස දක්වා ඇති (නෙළුම් මල් නිර්මාණය) කොටස් ය.

(27) ''වීනස් දි මේලෝ'' මූර්තිය නිර්මාණය කළ ග්‍රීක මූර්ති ශිල්පියා ය.

(28) සැරසිලි ඒකකයක් හෝ කිහිපයක් භාවිතා කර කිසියම් සීමාවක් තුළ කරන ලද සැරසිලිය.

(29) නෙල්ලි ගෙඩියක හැඩය ඇති දාගැබ් මේ නමින් හැඳින්වේ.

(30) නියඳ කෙඳි ලබාගැනීමට එම පත්‍ර තැලීම හා කෙඳි සීරීමට යොදාගත් උපකරණයයි.

(31) ස්ථපතිරායර් (32) වාත්තු කිරීම (33) රතු වැලි ගලින් (34) ධ්‍යාන මුද්‍රාව

(35) සාලබංජිකා නමින් (36) මෙම සිතුවම ''මැඩෝනා දෙලා සේදියා'' නම් සිත්තමයි

(37) මෙයින් දක්වෙන්නේ මරියතුමියට තුරුලු වී සිටින ජේසු බිළිඳාත් ඒ දෙස බලා සිටින ශාන්ත ජෝන් බැප්ටිස් ළදරුවාත් ය.

(38) මෙම අග්‍රගන්‍ය සිතුවම නිර්මාණය කරන ලද්දේ රෆායෙල් සාන්ත්සියෝ විසිනි.

(39) වෘත්තාකාර තලයක් තුළ මානව රූප ත්‍රිත්වය උඩට විහිදුණු ත්‍රිකෝණාකාර ආකෘතියකින් යුතුව සංරචනය කර ඇති අතර තෙල් සායම් භාවිතයෙන් වර්ණ ගන්වා ඇත.

(40) මරියතුමියගේ කාරුණික බව හා සෙනෙහසත්, ළදරුවන්ගේ මොළකැටි පුෂ්ටිමත් බවත් තාත්විකවාදී ස්වරූපයෙන් දැක්වීමට ශිල්පියා සමත් වී ඇත.

(ලකුණු 1x 40 = 40)

## II පත්‍රය – ස්වාභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | රේඛා අධ්‍යයනය | - ලකුණු 05 |
| (2) | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (3) | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (4) | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය ත්‍රිමාණ ලක්ෂණ ඇස් මට්ටම අවකාශ භාවිතය) | - ලකුණු 05 |
| (5) | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 05 |
| (6) | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව | - ලකුණු 05 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

II වන පත්‍රය සඳහා හිමි ලකුණු ලකුණු 30

### III පත්‍රය - "අ"කොටස - චිත්‍ර සංරචනය

**ලකුණු දීමේ නිර්ණායක**

| | | |
|---|---|---|
| (1) | තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු | - ලකුණු 06 |
| (2) | මානව රූ හා සත්ව රූ ඇතුළු සියලු හැඩතල තල මත සම්පිණ්ඩනය කර ඇති අයුරු | - ලකුණු 06 |
| (3) | සිද්ධාන්ත භාවිතය | - ලකුණු 06 |
| (4) | වර්ණ භාවිතයේ කුසලතා | - ලකුණු 06 |
| (5) | අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව | - ලකුණු 06 |
| | මුළු ලකුණු | - ලකුණු 30 |

### III පත්‍රය "ආ"කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය

**ලකුණු දීමේ නිර්ණායක**

| | | |
|---|---|---|
| (1) | මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවයකින් යුතුව සැලසුම් කිරීම | - ලකුණු 06 |
| (2) | පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව | - ලකුණු 06 |
| (3) | නිර්මාණාත්මක බව හා හැඩතල සම්පිණ්ඩනය කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| (4) | උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| (5) | විචිත්‍රත්වය, චමත්කාරජනක බව, සමස්ත නිමාව | - ලකුණු 06 |
| | මුළු ලකුණු | - ලකුණු 30 |

### III පත්‍රය "ඉ"කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

| | | |
|---|---|---|
| (1) | මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම. | - ලකුණු 06 |
| (2) | වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. | - ලකුණු 06 |
| (3) | රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| (4) | උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. | - ලකුණු 06 |
| (5) | විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව | - ලකුණු 06 |
| | මුළු ලකුණු | - ලකුණු 30 |

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |